ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media
No. 385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo - 10
Tel: off: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2026.01.26

| 01 | 24 |
|---|---|

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,

පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

# රාජ්‍ය සෞඛ්‍ය කළමණාකරණ සහකාර තනතුර සඳහා 213 කට පත්වීම් ලිපි ප්‍රදානය හෙට (27)

මෙරට ජනතාවට ගුණාත්මක සහ ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබාදීමේ අරමුණ පෙරදැරිව සෞඛ්‍ය සේවාවේ මානව සම්පත ශක්තිමත් කිරීමේ රජයේ වැඩපිළිවෙලට අනුව රාජ්‍ය සෞඛ්‍ය කළමණාකරණ සහකාර තනතුර සඳහා 213 දෙනෙකුට පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය කටයුතු සූදානම් කර ඇත.

එම පත්වීම් ප්‍රදානය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතාගේ ප්‍රධානත්වයෙන් හෙට (27) දින උදෑසන 9.30 ට කොළඹ පදනම් ආයතනයේ දී සිදු කිරීමට නියමිතය.

රාජ්‍ය සෞඛ්‍ය කළමණාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය පසුගිය 2021 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ නමුත් එම තරඟ විභාගය පවත්වන ලද්දේ 2025 වසරේ දීය.

එම තනතුර සඳහා 226 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබූ අතර, විවෘත තරඟ විභාගය අනුව සුදුසුකම් සපුරන ලද 246 දෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා භාජනය කර ඉහත 213 දෙනා එම තනතුර සඳහා තෝරා ගෙන ඇත.

රාජ්‍ය සෞඛ්‍ය කළමණාකරණ සහකාර තනතුර සඳහා අනුමත කාර්ය මණ්ඩලය 2,617 ක් වන අතර, 1,906 ක පිරිසක් මේ වන විට සෞඛ්‍ය සේවාවේ නිරත වේ.

දීප්ති විජේතුංග
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය මාධ්‍ය ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය